දුරකථන/ Telephone Nos.
தொலைபேசி இல.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister – 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary – 2784812

කාර්යාලය / அலுவலகம் / Office – 2785141-50
Fax – 2784846

ඊමේල් – ஈ-மெயில் /E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල

"இசுருபாய"
பத்தரமுல்ல

"Isurupaya",
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. – ED/1/17/2/HES/W05

ඔබේ අංකය / உமது இல. / Your No. –

දිනය / திகதி / Date – 2015.02.19

**චක්‍රලේඛ අංක : 09/2015**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
විෂය අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන්,

**ගෘහ ආර්ථික විද්‍යාව දැනුම මිනුම තරගය**

11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සහ ගෘහ ආර්ථික විද්‍යාව විෂයයක් ලෙස හදාරන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටින සිසුන්ගේ න්‍යායික හා ප්‍රායෝගික හැකියා සංවර්ධනය කිරීම උදෙසා දැනුම මිනුම තරගයක් වාර්ෂිකව පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෘහ ආර්ථික විද්‍යා අංශය මගින් සැලසුම් කර ඇත. ඒ අනුව මෙම තරග කොට්ඨාස, කලාප, පළාත් හා ජාතික මට්ටමින් පැවැත්වීමට සැලසුම් කරනු ලැබේ. (2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතුය.)

1. අභිමතාර්ථ
    1. සිසුන්ගේ ප්‍රායෝගික දැනුම නංවාලීම.
    2. න්‍යායාත්මක දැනුම තහවුරු කර ගැනීම.
    3. වැඩි පිරිසක් මෙම විෂයට යොමු කර ගැනීම.
    4. ගෘහ ආර්ථික විද්‍යා විෂය සඳහා ආකර්ශනය වර්ධනය කිරීම.
    5. අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීම.
    6. නිවැරදි පෝෂණ දැනුම ලබා දීම මගින් බෝනොවන රෝග වැළඳීමේ ප්‍රවණතාව අඩු කරලීම.
    7. නිවස තුළ සාමකාමී පරිසරයක් ගොඩ නැංවීම මගින් පවුල් ඒකකයේ සුරක්ෂිත බව තහවුරු කරලීම.
    8. අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාව ඔස්සේ ගෘහ ආර්ථික විද්‍යා විෂය හදාරන සිසුන් පිරිස වර්ධනය කිරීම.
    9. රැකියා වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය.

**2. තරග සඳහා පොදු උපදෙස්**

- තරගයට ඉදිරිපත් විය හැක්කේ 11 ශ්‍රේණියේ ගෘහ ආර්ථික විද්‍යාව විෂය හදාරන සිසු සිසුවියන්ට පමණි.
- සෑම තරගයකම අභිමතාර්ථ, කොන්දේසි හා ලකුණු ක්‍රමය සිසුන්ට පැහැදිලි කළ යුතුයි.
- තරග සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

**3. තරග මට්ටම් හා කාල වකවානු**

(i) පාසල් මට්ටමේ තරග - අප්‍රේල් 30 ට පෙර
(ii) කොට්ඨාස මට්ටමේ තරග - මැයි මස 15 ට පෙර
(iii) කලාප මට්ටමේ තරග - ජූනි 30 ට පෙර පැවැත්විය යුතුය.
(iv) පළාත් මට්ටමේ තරග - අගෝස්තු 31ට පෙර පැවැත්විය යුතුය.
(v) ජාතික මට්ටමේ තරග - සැප්තැම්බර් 30 ට පෙර පැවැත්විය යුතුය.

**3.1. තරග සඳහා විශේෂ උපදෙස්**

**3.1 – (i) පාසල් මට්ටම**

10 ශ්‍රේණියේ අවසාන වාර පරීක්ෂණයේ ලබාගත් ලකුණු මත පාසලේ එම විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වැඩිම ලකුණු ලැබූ සිසුන් පහත පරිදි කොට්ඨාස මට්ටමේ තරග සඳහා ඉදිරිපත් කළ යුතුය.

| ගෘහ ආර්ථික විද්‍යාව ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | කොට්ඨාස මට්ටමේ තරග සඳහා තෝරා ගත යුතු සංඛ්‍යාව |
|---|---|
| 01 – 05 | 1 |
| 06 – 10 | 2 |
| 11 – 20 | 3 |
| 21 – 30 | 4 |
| 31 හෝ ඊට වැඩි | 5 |

**3.1 – (ii) කොට්ඨාස මට්ටම**

සෑම කොට්ඨාසයකම එකම දිනයක දී එකම වේලාවකදී එකම ලිඛිත පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. එම පරීක්ෂණයේ දී සිසුන් විසින් ලබා ගන්නා ලකුණුවලට අනුව වැඩිම ලකුණු ලබන සිසුන් 10 දෙනෙකු තෝරා කලාප මට්ටමට යොමු කළ යුතුයි. තෝරා ගත් සිසුන්ගේ පිළිතුරු පත්‍රය ද ලකුණු සමග කලාපයට ඉදිරිපත් කළ යුතුයි. ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට හා විෂය අධ්‍යක්ෂ මහත්ම මහත්මීන්ට මෙහි ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වගකීම පැවරේ.

**3.1 – (iii) කලාප මට්ටම**

කලාප මට්ටමේ පරීක්ෂණය, ස්ථානීය පරීක්ෂණය (Spot Test) හා වාචික පරීක්ෂණය යන කොටස් දෙකකින් සමන්විත වේ. වාචික පරීක්ෂණයේ ලකුණු සහ ස්ථානීය පරීක්ෂණයේ ලකුණු එකතු කර වැඩිම ලකුණු ලබාගත් සිසුන් 10 දෙනා පළාත් මට්ටමේ තරගය සඳහා යොමුකළ යුතු වේ.
තරග සංවිධානය හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වගකීම කලාපයේ ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ.

**3.1 –(iv) පළාත් මට්ටම**

එක් කලාපයකින් සිසුන් 10 බැගින් කලාප සංඛ්‍යාව අනුකූලව පළාත් තරගය සඳහා ඉදිරිපත් කළ යුතුයි.
පළාත් තරගය ද ලිඛිත හා ස්ථානීය පරීක්ෂණයන් යන දෙකෙන්ම සමන්විත වනු ඇත.

- ❖ පළාතේ තරගයන් එක් ස්ථානයක දී එකම දිනයක දී ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය පැවැත්විය යුතුයි. එම තරග දෙකෙන් ලබා ගන්නා ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබන සිසුන් 10 දෙනා ජාතික මට්ටම සඳහා යොමු කළ යුතුයි. තරග සංවිධානය හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වගකීම පළාතේ ගෘහ ආර්ථික විද්‍යා විෂය අධ්‍යක්ෂ වෙත පැවරේ.